





Buddhist govi mother seeks a partner for her daughter, working in Sri Lankan Airline, as an Assist. Accountant, 25 yrs, 5'2" , well mannered, pretty and religious. Willing to settle down in Australia. For more info aunty in Queensland Tel 0747281531

NSMP 173

සිංහල බොදු උස අඩි 5 ක් වූ, සුදු, රූමත්, කොළඹ ජාත්‍යන්තර පාසලක ගුරුවරියක් ලෙස සේවය කරන, ළඟදී දික්කසාද වූ, වයස අවුරුදු 55 ක් වූ, ඉතා අඩු වයස් පෙනුමැති, සොහොයුරියට දැනට ඕසට්‍රේලියාවේ සිටින සොහොයුරිය, ස්ථිර ආදායමක් ඇති, යහපත් ගුණගරුක, ඕස්ට්‍රේලියාවේ පදිංචි ස්වාමිපුරුෂයකු සොයයි. බේද නොමැත. විස්තරය 1243.xyz@gmail.com මගින් දන්වන්න.

NSMP 172

බොදු ගොවි වයස 25 ක් වන ලංකාවේ රජයේ ගුරුවරියක් ලෙස සේවය කරන පවුලේ එකම සොහොයුරියට ස්ථිර රැකියාවක් ඇති ලංකාවේ හෝ ඕස්ට්‍රේලියාවේ පදිංචි වයස 30 කට නොවැඩි සුදුසු සහකරුවෙකු ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය ඇති සොහොයුරා සොයයි. විස්තර prasadxp1980@gmail.com ඊමේල් ලිපිනයට එවන්න.

NSMP 171

parents seek suitable partner for their pretty fair 27 years old daughter who works as an engineer in melbourne need all details with horascope email to jasmin.anoma@yahoo.com.au

NSMP 170

## සන්නස මංගල යෝජනා ප්‍රතිඵලදායකයි

G/B parents seek a well educated son for their daughter 29yrs, 5'4", Slim and Fair. Residing in Melbourne and working in a leading hospital as a Research Officer. Please email details and horoscope to s.r.leelaratne.2009@gmail.com

NSMP 174

ලංකාවේ පදිංචි බොදු ගොවි වයස අවුරුදු 35 යි විධායක ශ්‍රේණියේ රැකියාවක් කරන අඩි 5 අඟල් 3 උස ප්‍රියමනාප ශ්‍යාති සොයුරියට උගත් යහපත් ගතිගුණැති මනාලයකු සොයයි. විදේශගත වීමට ද කැමති ය. සියලු තොරතුරු prasad1976@hotmail.com වෙත හඳහන් කොපියත් සමග යොමු කරන්න.

NSMP 168

Sinhalese Buddhist parents seek a suitable partner for their divorced daughter with a child, currently doing higher studies and working in Australia.
She is 41 plus, 5 3" in tall attractive and brought up with Singhalese values. Please send email with details & contact numbers. propaus908@yahoo.com.au and Mobile No. 0450524490

NSMP 167




මෙල්බන්හි ස්ථිර පදිංචිය හිමි මෑතකදී ලංකාවෙන් පැමිණි සිංහල බොදු 34 උස 5 5 තඩවසම් පුතුට රූමත් චරිතවත් වයස 27 ට අඩු සහකාරියක් මව්පියෝ සොයති. ඕස්ට්‍රේලියාවේ ඉගෙනුම අවසන් කළ ශිෂ්‍යාවක් වුවද කම් නැත.
ඊමේල් chanlanka1976@gmail.com

NSMP 169

## SANNASA CLASSIFIEDS

### WORK FROM HOME

We are a boutique Financial and Real Estate services company operating in Victoria. Currently, we have a professional team and are in the process of expanding our operations.

We are seeking suitable candidates to join our team to generate sales leads in all metropolitan suburbs. The ideal candidates should be energetic and be able to provide leads to us on a continuous basis. In return, we provide you a very attractive referral fee structure which could generate extra cash for you (performance based). This is not a full-time employment and hence could be done with minimal effort. You may be currently employed full-time but looking for extra cash, this is a fantastic opportunity for you.

The pre-requisites for this are:

You should be 18 years or more
Currently living legally in Metropolitan Melbourne
Good credit history and no criminal record

If this is the right opportunity you have been waiting for, please send your resume to the following email address within 21 days of this advertisement.
**samsgroup@optusnet.com.au**

### New House for Sale

Newly built 2 storied, a bed house on a 18 perch land in Gonawala, Kelaniya. 90% complete, immediate sale, Rs 9.5 million. Beautiful river front. ideal for luxury living or for a tourist motel.
Tel (03) 9763 7206 or 0431 547 763.

27 පිටෙන්

උත්ප්‍රේරකයක් කර ගනිති. මේ සාධකය ජී. බී.සේනානායකගේ ස්වයං චරිතාපදානය, මම එදා සහ අද මෙන්ම ඔහුගේ අනෙකුත් කෘති ආශ්‍රයෙන්ද පැවසිය හැක.

ගත්කරු ජී. බී.සේනානායක අතිශයින්ම සංවේදී පුද්ගලයෙකු විය. තම කෘති අරභයා කෙරුනු විචාරයන් බොහෝ විට ඔහු පෞද්ගලික පහර දීම් මට්ටමේ ලා සැලකීය. ඔහු වරෙක මෙලෙස පවසයි. ,ලේඛකයන් බොහෝ කල් ජීවත් නොවිය යුතුය. ජීවත් වූවන්ගෙන් ඔවුනට වේදනා උපදවන අත්දැකීම් ලබන්නට සිදු වේ.,

මේ හැර ඔහුට සතුරු වූ ලේඛක කල්ලි ජී. බී.සේනානායකට පහර දුන් බව නොරහසකි. මේ හේතුවෙන්ද ඔහු මානසිකව ඇද වැටුනි. මම එදා සහ අද කෘතියේ 60 වන පිටෙහි ඔහු මෙලෙස සඳහන් කරයිරූ

"මා සාහිත්‍යයෙන් දස්කම් පෑ තැනැත්තෙකු ලෙස මාගේ සාහිත්‍ය ජීවිතයේ මුල් කාලයේම ඊර්ෂියාකාර කල්ලිකාරයෝ මා නැති කරන්නට නොයෙකුත් උපක්‍රම යෙදූහ. මටත් මගෙන් ජීවත් වූ අම්මාටත් ඔවුහු කරදර ඇති කල නමුත් මා නැති කරන්නට අසමත් වූහ.,

ජී. බී.සේනානායක තුල ඇතැම් විට තමා පිළිබඳ හීන වූ චිත්‍රය සහ හීන වූ ආත්ම අභිමානය (Low self esteem) ආක්ෂෝභිත බව ( Aggitation) ස්වයං අනුකම්පාව (Self pity) සහ ශුන්‍යවාදී අදහස් (Nihilistic ideas ) දක්නට ලැබෙයි.

තමා මිනිසුන්ගේ සිත් නොගන්නා පෙනුමක් ඇති අයෙකු බව ඔහු තරයේ විශ්වාස කලේය. එක් ස්ථානයකදී ඔහු තමාව හැඳින්වනුයේ අගුටුමිටි පෙනුමකින් යුතු විරූපී පුද්ගලයෙකු ලෙසටය.

ස්වයං අනුකම්පාව නිසා ඔහු තමාගේ කෘති විවේචනය ඉදිරියේ අතිශයින්ම සැලුනේය. මා අන්ධව සහ කොරව සිටිය ද විචාරකයෝ මට පහර ගසති යන්න ඔහු ප්‍රකාශ කරන ලදී. එසේම ස්වයං හුදකලාභාවයකට ( Alienation) ඔහු තමාව ලක් කොට සිටියේය. මම එදා සහ අද කෘතියේ 152 පිටුවේ ජී. බී.සේනානායක මෙසේ ලියයි. ,මම ඔවුන්ගේ ආශ්‍රයෙන් ඈත්වීමි. මා පාරේ යන කල සිංහල ලේඛකයෙකු ඈත එනු දුටුවොත් පාරේ අනෙක් පැත්තට වී ගමන් කිරීමට මම පුරුදු වී සිටියෙමි.,

ස්වයං වරදකාරී ගැටලු ජී. බී.සේනානායක එලිපිට පවසයි. තමාගේ මව රෝගාතුර වූ අවස්ථාවේ ඈ මිය ගියේ නම් හොඳය යන අදහස නිසා ඔහු තුල පසුතැවිල්ලක් ඇති විය. එම සිතුවිල්ල ඔහු සම කරන්නේ ටෝල්ස්ටෝයිගේ යුද්ධය හා සාමය නවකථාවේ තම මහලු පියාවූ බල්කෝන්ස්කි කුමරු මිය ගියේ නම් යෙහෙකි යන හැඟීම නිසා පශ්චාත්තාපයට පත්වූ මරියා බල්කෝන්ස්කියා කුමරියගේ හැඟීම් වලටය.

ඔහු තමා හා ඇමරිකානු ලේඛක එඩ්ගා ඇලන් පෝ අතර සමානතාවයන් දකියි. එසේම ඔහු එඩ්ගා ඇලන් ගේ කෙටි කථා ශෛලිය අනුගමනය කල බව මාටින් වික්‍රමසිංහ පවසා ඇත. එඩ්ගා ඇලන් පෝ ද තමා අත්විඳි විශාදය නිසා කායිකව මෙන්ම මානසිකව පීඩා විඳි ලේඛකයෙකි.

ජී. බී.සේනානායක කුඩා කාලයේ තමන්ට නිතරම ඇතිවූ හිසරදය සරස්වතී ආවේශයක් ලෙස හෝ තමන්ව ලියන්නට පොළඹවන බලවේගයක් ලෙසට සැලකීය. සත්‍ය වශයෙන්ම ඔහු මේ අත්විඳින ලද්දේ මනෝ කායික (පිහජයද ිදප්එසප) රෝගී තත්වයක් දැයි සැකයක් මතුවේ. ළමා කාලයේ අත්විඳින මානසික පීඩනයන් බොහෝ විට මනෝ කායික රෝග ඇති කරන බව ළමා රෝග විශේෂඥයන් පෙන්වා දෙති. ආත්ම ඝාතනය හෝ ජීවිතාශාවෙන් තොර වීම බොහෝ විට විශාදය සමග බැඳී පවතියි. ජී. බී.සේනානායක තුල ද මෙවැනි ආත්මහරණයේ සේයාවල් දක්නට තිබුනි. එසේම ඔහුගේ පවුලේ සාමාජිකයන් දෙදෙනෙකු (පියා සහ වැඩිමල් සොහොයුරා) දිවි තොර කර ගත් බව ඔහු පවසයි. එසේම ජී. බී.සේනානායක ද ඇතැම් විට ජීවිතය කෙරෙහි උකටලී බවක් පෙන්වන ලදී. පහත දැක්වෙන්නේ ඔහු විසින් රචනා කරන ලද කවියකි. එහි කවියා තුල තිබූ මරනීය ආශයේ (ඎඑය ෂඩ්එසබපජඑ) සක්‍රියතාව පෙනී යයි.

*නයා*

*නයෙකු නැගුනොත් මගේ ඇඳට*
*තුරුළු කර ගනිමි මම ඌ*
*සපන්න මිතුර මා*
*කරුණාවෙන්*
*යවන්න මා එහා ලෝකෙටයි කියා*

මේ හැර ජී. බී.සේනානායකයන්ගේ ආත්ම ඝාතක සංකල්ප ඇතැම් විට ඔහුගේ කෘති වල එන චරිත හරහා ද නිරූපනය කරයි.

මනෝ විශේෂඥ ආරෝන් බෙක් විශාදය පිළිබඳව තමාගේ ප්‍රජානන න්‍යාය මගින් ස්වයං අවතක්සේරුව, සෘණාත්මක දැක්ම මෙන්ම අර්ථකථනය සහ අනාගතය පිළිබඳව අශුභවාදී දැක්ම හේතු වන බව පවසයි. ආරෝන් බෙක්ගේ පෙන්වා දීම් තුලින් සහ විශාදය පිළිබඳ බෙක්ගේ නිර්නායකයන්ට (ඊැපනි ිජ්කැ)* අනුව මහා ගත් කරු ජී. බී.සේනානායක තුල විශාදයේ ලක්ෂන තිබූ බව කිව හැකිය. එසේම කෙලර් සහ ෂැෆීරෝ විසින් විශාදයට පත්වූ පුද්ගලයන් තුල මරනීය සාධකයන් ගොඩනැගීමේ ක්‍රියාවලිය පැහැදිලිවම පෙන්වා දෙන ලදී. මෙම පැහැදිලි කිරීම් අනුසාරයෙන් ජී. බී.සේනානායකයන්ගේ ජීවිතයේ අවසාන කාලයේ තිබූ මරනීය ආශයේ ප්‍රබලතාව පෙන්වා දිය හැකි ය. එහෙත් ඔහු දිවි නසා ගැනීමට යොමු නොවීය.

අද්විතීය ගත්කරු ජී. බී.සේනානායක විශාදයෙන් පෙලුනේද යන්න තුළ සායනික මෙන්ම සාහිත්‍යමය වශයෙන්ද කාලීන බවක් තිබේ. ඒ මන්ද යත් ඔහුගේ නිර්මාණ තුළ මෙම විශාදයේ සේයාවන් ඇති නිසාවෙනි. එහෙත් එම නිසා ඔහුගේ නිර්මාණ වටිනාකමින් අඩු නොවේ. ඔහුගේ නිර්මාණ මිණි කැට වැනිය. එකී නිර්මාණ වල සාහිත්‍යමය මෙන්ම දාර්ශනික ගැඹුරක් තිබේ. චිත්ත තත්වයන් අරභයා ඔහු විසින් කරන ලද විවරණයන් සලකා බැලීමේදී ජී. බී.සේනානායක යනු ලාංකික දොස්තොයෙව්ස්කි ද යැයි සිතේ.